# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026

**මෙම විභාගයේදී සෑම විභාග අපේක්ෂකයෙකුම අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ මාර්ගගත (online) ක්‍රමය මගිනි.**

උක්ත විභාගය සඳහා පෞද්ගලික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීම 2026 ජුලි මස 03 දින සිට 2026 ජුලි මස 23 දින දක්වා සිදු කරනු ලැබේ. සෑම පෞද්ගලික අයදුම්කරුවෙකු ම මෙම නිවේදනය සම්පූර්ණයෙන් ම හොඳින් කියවා අවබෝධ කර ගෙන තම අයදුම්පත මාර්ගගත ආකාරයෙන් (online) සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී විභාගයට පෙනී සිටීමට තෝරා ගත් **නගරය, විෂයයන් හා මාධ්‍යය** ඇතුළත් කිරීමේදී නිවැරදිව ම ඇතුළත් කිරීමට විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

**02. අයදුම්පත්**

2.1 **මාර්ගගත ආකාරයට අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව PDF ගොනුවේ මුද්‍රිත පිටපත ලබා ගැනීම අනිවාර්යය වන අතර,** අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කිරීම සඳහා සුරක්ෂිතව තබා ගත යුතුය. **මුද්‍රණය කරගත් පිටපත දෙපාර්තමේන්තුවට එවීම අවශ්‍ය නොවේ.**

> **රජයේ පාසලක ඉගෙනුම ලබමින් පෞද්ගලික අයදුම්කරුවන් ලෙස විභාගයට අයදුම් කිරීම සපුරා තහනම් වේ. එසේ පෙනී සිටීමක් අනාවරණය වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කර ඉදිරි විභාග සඳහා පෙනී සිටීම ද තහනම් කරනු ලැබේ.**

2.2 2026 ජුලි මස 23 වන දින මධ්‍යම රාත්‍රී 12.00 පැයෙන් පසුව මෙම විභාගය සඳහා අයදුම් කළ නොහැක.

2.3 **එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පත්‍ර එකකට වඩා ඉදිරිපත් කරන අවස්ථාවල දී සියලු ම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එම අයදුම්කරුවන් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව පියවර ගනු ලැබේ. විභාග ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු වුව ද මෙවැනි වංචනික ක්‍රියාවක් ඔප්පු වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කර අදාළ නීත්‍යානුකූල පියවර ක්‍රියාත්මක කරනු ලැබේ.**

**03. පද්ධතියට ප්‍රවේශ වීම හා අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා විභාග අයදුම්කරුවන්ට තාක්ෂණික උපදෙස්**

3.1 අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ,

- නිල වෙබ් අඩවිය (https://doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "Exam Information Center" මත Click කිරීම මගින් හෝ,
- https://onlineexams.gov.lk/eic වෙත පිවිසෙන්න.

3.2 පළමුව ඔබගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකථන අංකය ඇතුළත් කර ලියාපදිංචි විය යුතුය.

3.3 ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් පසුව ඔබට ලැබෙන කෙටි පණිවිඩයෙහි (SMS) සඳහන් කේත අංකය (OTP) භාවිත කර පද්ධතියට ප්‍රවේශ විය යුතු ය.

3.4 උපදෙස් සඳහා "Instructions" ලෙස පෙන්වන බොත්තම (Button) තෝරන්න (Click). තාක්ෂණික උපදෙස්, පොදු උපදෙස් හා උපදෙස් වීඩියෝව නැරඹීමෙන් අනතුරුව "Next" බොත්තම (Button) තෝරා අයදුම්පත සම්පූර්ණ කිරීම ආරම්භ කරන්න.

3.5 ප්‍රවේශපත්‍ර වල සඳහන් කෙරෙන නමෙහි දෝෂ අවම කර ගැනීම සඳහා උප්පැන්න සහතිකයේ පරිදි **සම්පූර්ණ නම දෙවතාවක් ඇතුළත් කළ යුතුය.** එහි යම් නොගැලපීමක් සිදු වුවහොත් නැවත මුල සිට නම දෙවතාවම ඇතුළත් කළ යුතුය.

04. **විභාග ගාස්තු ගෙවීම හා අයදුම්පත බාගත (Download) කිරීම**

විභාග ගාස්තු ගෙවීම තැපැල් කාර්යාල මගින් හෝ බැංකු කාඩ්පත් මගින් (Credit/Debit payment) සිදු කළ හැකිය.

4.1. තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කරන්නේ නම්, "Payment Method" යටතේ ඇති "Pay by Department of Posts" සබැඳිය තෝරා ගත යුතු ය. **එහිදී ඔබට ලැබෙන යොමු අංකය (Reference Number) තැපැල් කාර්යාලයට ලබාදී ඔබගේ විභාග ගාස්තු ගෙවා ලබා ගන්නා කුවිතාන්සිය ඔබ භාරයේ සුරක්ෂිතව තබා ගත යුතු ය.**
**එම කුවිතාන්සියේ "අ.පො.ස.(සා.පෙළ) 2026 විභාග ගාස්තු" ලෙස පැහැදිලිව සටහන් විය යුතු වේ.**

**ගෙවීම සාර්ථක වූ පසු ඔබට ලැබෙන කෙටි පණිවිඩයේ ඇති සබැඳිය (link) සක්‍රිය කිරීම මගින් අදාළ වෙබ් අඩවියට පිවිස අයදුම්පත බාගත කර ගැනීමට හැකි වේ.**

4.2 බැංකු කාඩ්පත් (Credit/Debit cards) මගින් ගෙවීම සඳහා "Payment method" යටතේ ඇති "pay by credit/debit card" අයිතමය තෝරා ගත යුතුය.

4.3 විෂයන් ගණන අනුව ගාස්තු අය කිරීම පහත පරිදි වේ.

| විෂයය ගණන | 1 | 2 | 3 | 4 | 5 | 6 - 9 |
|---|---|---|---|---|---|---|
| ගාස්තුව රුපියල් | 100/- | 150/- | 200/- | 250/- | 300/- | 350/- |

05. ඔබ තෝරා ගන්නා විෂයයන් හා නගරය ඉතා වැදගත් වේ. යම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් ආසන්නතම නගරයේ ඇති විභාග මධ්‍යස්ථානයට යොමු කිරීම සිදු වේ.

06. ඔබගේ විභාග ප්‍රවේශ පත්‍රය ලැබුණු වහාම එම ප්‍රවේශ පත්‍රයේ නම, විෂයය හා මාධ්‍ය සම්බන්ධ සංශෝධනයන් ඇත්නම් ඒවා මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කර ගැනීමට පහසුකම් සලසා ඇත.

07. **සෑම පෞද්ගලික අයදුම්කරුවෙක් ම තමාගේ ස්ථිර පදිංචි ලිපිනය ඇතුළත් කළ යුතු අතර අධ්‍යාපනය ලබන පෞද්ගලික හෝ ජාත්‍යන්තර පාසලේ නම සහ ලිපිනය ඇතුළත් නොකළ යුතු ය. ඔවුන් තම පෞද්ගලික දුරකථන අංකය ද ඇතුළත් කළ යුතු ය.**

08. **අනන්‍යතාව ඔප්පු කිරීම**

විභාග ශාලාවේදී අයදුම්කරුවන් තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. විභාගයට පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම තම අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා හඳුනාගැනීමේ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

09. මෙම විභාගය සඳහා අයදුම්කරනු ලබන **විශේෂ අවශ්‍යතා** සහිත අයදුම්කරුවන් වේ නම්, "Are you a special needs candidate?" හි Yes යටතේ තිබෙන තොරතුරු සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

10. **විශේෂයෙන් සැලකිය යුතුයි**

10.1 මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු, සම්පූර්ණයෙන් හෝ අඩක් හෝ ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක ගාස්තුව වශයෙන් මාරු කිරීම හෝ කරනු නොලැබේ.

10.2 **විභාගයට අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු කිසිදු හේතුවක් නිසා විභාග මධ්‍යස්ථානය වෙනස් කරනු නොලැබේ. එබැවින් ඔබගේ දත්ත නිවැරදිව ඇතුළත් කළ යුතු ය.**

10.3 දෙවන විෂය කාණ්ඩයට අයත් පහත සඳහන් විෂයයන් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු වේ. මෙම අවශ්‍යතාවය සම්පූර්ණ නොකරන අයදුම්කරුවන්ට ලිඛිත විභාගයට පෙනී සිටිය ද ප්‍රතිඵල නිකුත් කරනු නොලැබේ.

(40) සංගීතය (පෙරදිග)
(41) සංගීතය (අපරදිග)
(42) සංගීතය (කර්ණාටක)
(44) නැටුම් (දේශීය)
(45) නැටුම් (භරත)
(50) නාට්‍ය හා රංග කලාව (සිංහල)
(51) නාට්‍ය හා රංග කලාව (දෙමළ)
(52) නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)

උක්ත කරුණු සම්බන්ධයෙන් තවදුරටත් තොරතුරු අවශ්‍ය වන්නේ නම් පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය මඟින් හෝ දුරකථන අංක මඟින් විමසීම් සිදු කළ හැකිය.

විද්‍යුත් තැපෑල : gceolexamsl@gmail.com

දුරකථන අංක : 011-2784208 / 011-2784537/ 011-2785922

**මාර්ගගත ඒකකය**
දුරකථන අංක : 011-3671568 / 011-3661122

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

යොමු අංකය : 6/4/OL/2026
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1503, කොළඹ.
2026.07.03

U.I.A.6.4.OL Paper AD 2024 2025